


## ගරු ඩොලින්ඩෝ රුටොලෝ පියතුමාට ජේසුස් සමිඳාණන් වහන්සේ කියාදුන් ආකාරයට,

# ජේසු සමිඳාණන් වහන්සේට මාව පවරාදීමේ යාච්ඤාව

# අහෝ ජේසුනි, මම ඔබවහන්සේට මාව පවරාදෙමි.

1970, නොවැම්බර් 19 වන දින, ඩොලින්ඩෝ රුටොලෝ පියතුමා අවුරුදු 88 ක් දිවි ගෙවා ස්වර්ගස්ථ විය. එතුමා අපේ කාලයේ දිවැසිවරයෙකි. ශු. පියෝ පියතුමා, ඉතාලියේ නේපල් හි විසූ මේ පියතුමා ගැන වරක් මෙසේ කීවේය, "මුළු ස්වර්ගයම ඔබගේ ආත්මය තුළ ය." එතුමාගේ 'ඩොලින්ඩෝයන' නමෙහි අර්ථය වන්නේ 'වේදනාව' යන්නයි. එමෙන්ම, එතුමාගේ ජීවිතය මේ වේදනාවෙන් සංතෘප්ත වී තිබිණි. ළමයෙකු, ගැටවරයෙකු, පූජක ශිෂ්‍යයෙකු සහ පූජාප්‍රසාදිවරයෙකුද ලෙස, එතුමාට එකකට පසු එකක් ලෙස නිරන්තර අපහාස කිරීම් අත්දකින්නට සිදුවිය, එක් රාජගුරුප්‍රසාදි තුමෙකු විසින් කියන ලද මේ දිවැසිවර වචන එමගින් සාක්ෂාත් විය, "ඔබ ප්‍රාණ පරිත්‍යාගිවරයෙකු වෙන්නෙහිය, එහෙත් ඒ ඔබගේ රුධිරයෙන් නොව, ඔබගේ හදවත තුළිනි."

එතුමාගේ ගැඹුරු බැහැපත්කම තුළ, ජේසුස් වහන්සේගේ වචන ඇසීමට එතුමාට හැකි විය. එතුමාගේ සැඟවුණ දිවිය තුළ වුවද, එතුමා පසුගිය ශත වර්ෂයේ සිටි ශ්‍රේෂ්ඨ දිවැසිවරයන්ගෙන් කෙනෙකි. සීමාවන්ගෙන් එහා කොමියුනිස්ට් පීඩන පාලනයෙන් දමන ලද යදම් කැඩීමට සමත් වීර පියවර ගත හැකි නව පුවාම් කෙනෙකු පෝලන්තයෙන් නැගී සිටින බව 1965 දී ගරු ඩොලින්ඩෝ පියතුමා, හිනිල්කා රාජගුරුප්‍රසාදි තුමාට, ලියා යැව්වේය. කොමියුනිස්ට් රාජ්‍ය පාලනය යටතේ වේදනා විඳිමින් සිටි පෝලන්තය සහ අනෙක් සියලු රටවල් වලට සැනසීමේ වචන මේ තැපැල්පතෙහි එතුමා ලිව්වේය. මේ දිවැසිවර වැකිය, දෙවැනි පුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමාගේ කාලයේදී සැබෑ විය.

එතුමාගේ අධික වේදනාව තුළ, ඩොලින්ඩෝ පියතුමා වඩ වඩාත් කුඩා ළමයෙකු ලෙස බැහැපත්ව දෙවිඳුන් මත යැපුණු අතර, දෙව්පියාණන් වහන්සේට තම ආත්ම-පූජාවෙන් දිවි ගෙවීය. අතිශය වේදනාවන් තුළ ඩොලින්ඩෝ පියතුමා කුඩා දරුවෙකු ලෙසින් වඩ වඩාත් එතුමාගේ වේදනාවන් පුදකර සිටියේ, "මම දිළිඳු කෙනෙක්මි, දිළිඳුකමේත් කිසිවක්ම නැත්තෙක්මි. මාගේ ශක්තිය යාච්ඤාවයි, මාගේ නියමුවා, දේව කැමැත්තයි. ඒ සඳහා මගේ අත ගැනීමට මම ඉඩ දෙමි. රළු මාවත මත මගේ ආරක්ෂිකාව ස්වර්ගීය මව වන දේව මාතාවන්ය." යැයි කියමිනි.

ගරු ඩොලින්ඩෝ පියතුමාට, ජේසුස් ස්වාමීන් වහන්සේ කියා දුන් ඉතාමත්ම අගනා ඉගැන්වීම නම්, දෙවියන් වහන්සේ උදෙසා සියල්ල අත්හැරීමයි, මේ යාච්ඤාව තුළින්, ජේසුස් ස්වාමීන් වහන්සේ ඩොලින්ඩෝ පියතුමාට මෙන්ම ඔබටත් කතා කරන සේක.

# පටුන


**නුවානය පළමු දිනය ............................................................................................................4**

**දෙවන දිනය.......................................................................................................................5**

**තුන් වන දිනය ....................................................................................................................6**

**හතර වන දිනය ...................................................................................................................6**

**පස් වන දිනය......................................................................................................................7**

**හය වන දිනය......................................................................................................................7**

**හත් වන දිනය .....................................................................................................................8**

**අට වන දිනය......................................................................................................................8**

**නමවැනි දිනය.....................................................................................................................9**


සිංහල පරිවර්තනය හා සැකසුම: ගරු ගියොම් නෝනිස් පියතුමා

**ජේසුස් වහන්සේ ඔබට කතා කරන ලෙසට,**

**මේ යාච්ඤාව දිගටම කියවන්න.**

මෙය දින නවයක නුවානයක් ලෙස ඔබට කිරීමට අවශ්‍ය නම්, එක කොටසක් එක දවසකට කියා, පිළිතුර තුන් වරක් වෙනුවට දහ වරක් කියන්න.

**ජේසු සමිඳාණන් වහන්සේ මෙසේ වදාරණ සේක:**

ඔබ කරදර වෙමින් ඔබව ව්‍යාකූල කර ගන්නේ ඇයි? ඔබගේ කාරණා මගේ පාලනයට බාර දෙන්න. එවිට සියල්ල සාමකාමී වනු ඇත. සැබවින්ම මම ඔබට කියමි, ඔබ දෑස් වසාගෙන, සත්‍ය ලෙස හා සම්පූර්ණයෙන් මට පවරාදෙන සෑම කටයුත්තක්ම, එහි සියලු දුෂ්කර තත්ත්ව විසඳා ඔබට අවශ්‍ය ප්‍රථිඵල මම ලබා දෙමි.

## නුවානය පළමු දිනය

**අහෝ ජේසුනි, මම ඔබවහන්සේට මාව පවරා දෙමි, සියල්ලම ඔබවහන්සේගේ කැමැත්ත අනුව සිදු වේවා!** (තුන් වරක්).

මට ඔබව පවරාදීම යන්නෙන් අදහස් කරන්නේ නොසන්සුන් වීමවත්, කලබල වීම හෝ බලාපොරොත්තු නැති කර ගැනීම වත්, කණස්සල්ලෙන් කරන යාච්ඤා මට ඔප්පු කිරීමවත්, ඔබව අනුගමනය කිරීමට මගෙන් ඉල්ලීමවත් නොවේ. කණස්සලු වීම, කලබල වීම, සහ ඕනෑම දෙයක ප්‍රතිවිපාක සිතීමට පෙළඹීම, මේ පවරා දීමට අතිශයින්ම පටහැනි වේ.

එවැන්නක්, කුඩා දරුවෙකු තම මවගෙන් තමාගේ අවශ්‍යතාවයන් ඉල්ලා සිටීමෙන් පසු, ඔහු විසින්ම එම අවශ්‍යතාවයන් සපුරා ගැනීමට උත්සාහ කරන විට, මවගේ ක්‍රියාවට එම දරුවාගෙන් වන බාධාවට සමානය.

පවරාදීම යනු, මට පමණක් ඔබ මත ක්‍රියා කිරීමට හැකි වනු පිණිස, ශාන්ත සිතින්, ආත්මයේ නෙත් වසා ගනිමින්, කැළඹිලි සහගත හැඟීම්වලින් බැහැර වෙමින්, "සියල්ල ඔබවහන්සේ ගේ කැමැත්ත අනුව සිදුවේවා" යැයි කියමින්, ඔබව මාගේ රැකවරණයට බාර කිරීමයි.

## දෙවන දිනය

**අහෝ ජේසුනි, මම ඔබවහන්සේට මාව පවරා දෙමි, සියල්ලම ඔබවහන්සේගේ කැමැත්ත අනුව සිදු වේවා!** (තුන් වරක්)

ආධ්‍යාත්මික සහ ලෞකික අවශ්‍යතා බොහෝ සෙයින් ඇති ආත්මය මා වෙත හැරී, මා දෙස බලා, "ඔබවහන්සේගේ කැමැත්ත අනුව සියල්ල සිදුවේවා." යැයි මට පවසමින් තම දෙනෙත් වසාගෙන සන්සුන්ව සිටින්නේ නම්, මම කොතරම් මහත් දේ ඔහුට කරමි ද?

ඔබ, වේදනාව තුළ මට ක්‍රියා කිරීමට යාච්ඤා කළත්, ඔබට අවශ්‍ය ආකාරයට මා ක්‍රියා කරනු පිණිස ඔබ එය කරන්නෙහිය. ඔබ මා වෙත හැරෙනු වෙනුවට ඔබට අවශ්‍ය වන්නේ ඔබගේ අදහස් වලට අනුකූල වන පරිදි මාව වෙනස් කර ගැනීමටයි. ඔබ, තම වෛද්‍යවරයාට ඔබව සුව කරන්න යැයි ඉල්ලන රෝගීන් නොව, තමන්ව සුව කරන්නේ කිනම් ආකාරයෙන්දැයි තම වෛද්‍යවරයාට පවසන රෝගීන් වැනිය! ඒ නිසා මේ අයුරින් ක්‍රියා නොකරන්න, ඒ වෙනුවට පරමණ්ඩල යාච්ඤාවේ මා ඔබට ඉගැන්වූ පරිදි, "ඔබවහන්සේගේ ශ්‍රී නාමයට ආරාධිත වේවා," යි කියා ඔබගේ අවශ්‍යතාවේදී ප්‍රශංසා කරන්න. "ඔබවහන්සේගේ රාජ්‍යය පැමිණේවා," යන්නෙන් අදහස් කරන්නේ අප තුළ තිබෙන සියල්ලම ඔබවහන්සේගේ රාජ්‍යයයට අනුකූල වීමයි. "ස්වර්ගයෙහිදී මෙන් මෙලොවෙහිදීද ඔබගේ කැමැත්ත ඉටු වේවා." යන්නෙන් අදහස් කරන්නේ අපේ ලෞකික සහ සදාතනික ජීවිතයේ අවශ්‍යතාවයන් ඔබවහන්සේගේ කැමැත්ත අනුව තීරණය කිරීමයි.

ඔබ මට සත්‍ය ලෙසටම "ඔබවහන්සේගේ කැමැත්ත සිදු වේවා." යැයි කියන්නේ නම්, එය, "ඔබවහන්සේගේ පාලනයට ගත මැනව." යනුවෙන් කීම හා සමාන වේ. එවිට, මම මගේ මුළු සර්වබලධාරීත්වය තුළින් මැදහත් වෙමින්, අති දුෂ්කර තත්ත්ව විසඳා දෙන්නෙමි.

## තුන් වන දිනය

**අහෝ ජේසුනි, මම ඔබවහන්සේට මාව පවරා දෙමි, සියල්ලම ඔබවහන්සේගේ කැමැත්ත අනුව සිදු වේවා!** (තුන් වරක්)

නපුර දුර්වල වීම වෙනුවට වර්ධනය වීම ඔබට පෙනෙනවාද? එවිට කලබල නොවන්න. ඔබගේ දෙනෙත් වසා ගෙන විශ්වාසයෙන් මට මෙසේ කියන්න, "ඔබවහන්සේගේ කැමැත්ත සිදු වේවා, එය ඔබවහන්සේගේ පාලනයට ගත මැනව." මා එහි පාලනය මගේ යටතට ගන්නා බව, මම ඔබට කියමි, තවද මා වෛද්‍යවරයෙකු ලෙස මැදහත් වී, ප්‍රාතිහාර්ය අවශ්‍ය වූ කල මම ඒවා සිදු කරමි. රෝගී පුද්ගලයාගේ රෝගී බව වැඩි වන ලෙස ඔබට පෙනේද? කලබල නොවන්න, එහෙත් ඔබගේ දෙනෙත් වසා ගෙන මෙසේ කියන්න, "ඔබවහන්සේගේ කැමැත්ත අනුව එය සිදු වේවා." මා එහි පාලනය මගේ යටතට ගන්නා බව මම ඔබට කියමි, එසේම, මගේ ප්‍රේමණීය මැදහත් වීමට වඩා බලසම්පන්න ඖෂධයක් නැත. මගේ ආදරය මගින්, මම මෙය ඔබට පොරොන්දු වෙමි.

## හතර වන දිනය

**අහෝ ජේසුනි, මම ඔබවහන්සේට මාව පවරා දෙමි, සියල්ලම ඔබවහන්සේගේ කැමැත්ත අනුව සිදු වේවා!** (තුන් වරක්)

ඔබට පෙනෙන මාවතට වඩා වෙනස් මාවතක මා ඔබ ගෙන යා යුතු කල්හි, මම ඔබ ඒ සඳහා සූදානම් කරවමි. මම ඔබව මගේ බාහු මත උසුලා ගෙන යමි; තම අම්මාගේ දෑත් මත නින්ද ගොස් තිබෙන දරුවන් සේ, ගඟේ අනෙක් ඉවුරේදී, ඔබව සොයා ගැනීමට මම ඔබට සලස්වන්නෙමි.

ඔබට කරදර කරන, ඔබට මහත් සේ රිදවන දේ වනුයේ ඔබේ හේතු, ඔබේ අදහස්, ඔබේ කණස්සල්ල සහ ඔබව දුකට පත් කරමින් කුමන හෝ ආකාරයෙන් ලබා ගැනීමට ඔබ පොරකන ඔබේ ආශාවන්ය.

## පස් වන දිනය

**අහෝ ජේසුනි, මම ඔබවහන්සේට මාව පවරා දෙමි, සියල්ලම ඔබවහන්සේගේ කැමැත්ත අනුව සිදු වේවා!** (තුන් වරක්)

ඔබට සියල්ලම විමසා බැලීමටත්, සියල්ලම මෙහෙයවීමටත්, සියල්ලම දැකීමටත් අවශ්‍ය වන අතර ඔබ කරදර වෙමින් නොනිදා සිටින්නෙහිය. තවද ඔබ මිනිස් ශක්තියට යටපත් වෙමින් මනුෂ්‍යයන්ගේ මැදහත්කම විශ්වාස කරමින් සිටින බැවින් මාගේ වචන සහ මාගේ අදහස් ඔබ තුළ ක්‍රියා කිරීමට ඔබ බාධා කරන්නෙහිය.

අහෝ ඔබට උදව් කිරීමට මා මේ පවරාදීම කොතරම් ඔබගෙන් ප්‍රාර්ථනා කරනවාද, එමෙන්ම ඔබ ඔතරම් කලබල වී සිටිනු මා දකින විට මා කොතරම් වේදනා විඳිනවාද! සාතන් කිරීමට උත්සාහ ගන්නේත් හරියටම මෙයයි; එනම් ඔබව කලබල කර, මගේ ආරක්ෂාවෙන් ඔබව ඉවත් කර, මිනිස් ශක්තියේ හකු තුළට ඔබව විසිකර දැමීමටයි. ඒ නිසා මාව පමණක් විශ්වාස කර, මා තුළ සැනසීම ලබමින් සියල්ලේදීම ඔබව මට පවරාදෙන්න.

## හය වන දිනය

**අහෝ ජේසුනි, මම ඔබවහන්සේට මාව පවරා දෙමි, සියල්ලම ඔබවහන්සේගේ කැමැත්ත අනුව සිදු වේවා!** (තුන් වරක්)

ඔබ ගැන නොසිතා ඔබ මා වෙත ඔබව පවරාදෙන ප්‍රමාණයට අනුව මම ප්‍රාතිහාර්ය සිදු කරමි. ඔබ අන්ත දුගී තත්ත්වයේ සිටින විට මගේ වරප්‍රසාදීය වස්තු සම්භාරයෙන් මම ඔබව පිරී ඉතිරී යාමට සලස්වන්නෙමි. දාර්ශනිකයෙකු, බුද්ධිමතෙකු, සාන්තුවරයෙකු තුළ පවා ප්‍රාතිහාර්ය සිදු වීමට නම් මගේ වරප්‍රසාදය තිබිය යුතුමය. තමන්ව දෙවියන් වහන්සේට පවරා දෙන කවරෙකු වුවද ප්‍රාතිහාර්ය අත්දකින්නේය.

ඔබගේ මනස තියුණු බැවින් ඔබට නපුර දකිමින්, මාව විශ්වාස කරමින් සහ ඔබ ගැන නොසිතා සිටීම ඉතා අපහසුය. එබැවින් තවදුරටත් නොසිතා ඔබගේ හැම අවශ්‍යතාවකදීම ඔබව මට පවරා දෙන්න. ඔබගේ සියලු අවශ්‍යතාවලදී ඔබ සියලු දෙනාම මෙය කරන්න, එවිට ඔබ නිරන්තරයෙන් තොරක් නැති නිහඬ ප්‍රාතිහාර්ය දකිනු ඇත. මම දේවල් මගේ පාලනයට ගෙන බලා ගනිමි, මම ඒ ගැන ඔබට පොරොන්දු වෙමි.

## හත් වන දිනය

**අහෝ ජේසුනි, මම ඔබවහන්සේට මාව පවරා දෙමි, සියල්ලම ඔබවහන්සේගේ කැමැත්ත අනුව සිදු වේවා!** (තුන් වරක්)

ඔබගේ දෙනෙත් වසා ගෙන, මාගෙන් ගලා එන්නාවූ ආශිර්වාදයේ දියදහරේ ඔබව රැගෙන යාමට ඉඩ හරින්න. ඔබගේ දෙනෙත් වසා ගෙන, වර්තමානය ගැන නොසිතා අනාගතය ගැන සිතුවිලි වලිනුත්, දුර්පරික්ෂාවලිනුත් බැහැර වන්න. මගේ යහපත්කම ගැන පමණක් විශ්වාස කරන්න. එවිට, ඔබ "ඔබවහන්සේගේ කැමත්ත අනුව එය සිදු වේවා" කියන විට, මා එය මුළුමනින්ම මගේ පාලනයට ගෙන බලා ගන්නා බවට මගේ ආදරය මගින් මම ඔබට පොරොන්දු වෙමි. මම ඔබව නිදහස් කර ගෙන, ඔබට සැනසීම දී, ඔබට මග පෙන්වන්නෙමි.

## අට වන දිනය

**අහෝ ජේසුනි, මම ඔබවහන්සේට මාව පවරා දෙමි, සියල්ලම ඔබවහන්සේගේ කැමැත්ත අනුව සිදු වේවා!** (තුන් වරක්)

හැමවිටම ඔබව මට පවරාදීමට සූදානමකින් යුතුව යාච්ඤා කරන්න. එවිට, එමගින් ඔබට ඉමහත් සාමයක් සහ ඉමහත් යහපත් විපාක ලැබෙන්නෙහිය. මා ඔබ මත, යාගවීමේ, පසුතැවිලි වීමේ සහ ආදරයේ වරප්‍රසාද දානය කරන විට පවා එසේම කරන්න. එවිට දුක් වේදනාව කුමක්ද? එය ඔබට කළ නොහැකි හෝ විය නොහැකි දෙයක් සේ පෙනෙනවාද? ඔබගේ ඇස් වසා ගෙන, ඔබගේ මුළු ආත්මයෙන්ම මෙසේ කියන්න, "ජේසුනි, ඔබවහන්සේගේ කැමැත්ත අනුව එය සිදු වේවා." බිය නොවන්න, මම එම දේවල්වල පාලනය මගේ අතට ගන්නෙමි, තවද, ඔබ, ඔබව මට පවරා දීම මගින් මගේ නාමය මහිමයට පමුණුවන්නෙහිය.

එකම එක යටහත් පහත් වීමේ ක්‍රියාවක්, දහසක් යාච්ඤාවලට වඩා අගනේය. මෙය හොඳින් මතක තබා ගන්න, මෙයට වඩා ප්‍රතිඵලදායක වෙනත් නුවානයක් නැත: "අහෝ ජේසුනි, මම ඔබවහන්සේට මාව පවරා දෙමි, සියල්ලම ඔබවහන්සේගේ කැමැත්ත අනුව සිදු වේවා!"

## නමවැනි දවස

**අහෝ ජේසුනි, මම ඔබවහන්සේට මාව පවරා දෙමි, සියල්ලම ඔබවහන්සේගේ කැමැත්ත අනුව සිදු වේවා!** (තුන් වරක්)

දේව මෑණියනි, මම ඔබතුමියට සදා අයිති වෙමි, ඔබතුමියගේ මධ්‍යස්ථ කමින් හා ඔබතුමිය සමඟ ජේසුස් ස්වාමීන් වහන්සේට සදා සහමුලින්ම අයිතිවීම මාගේ ඕනෑකමයි. ආමෙන්.

සිංහල පරිවර්තනය හා සැකසුම: ගරු ගියොම් නෝනිස් පියතුමා